# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2021/49 - 2017 ජුනි මස 02 වැනි සිකුරාදා - 2017.06.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සමිති ආඥාපනත

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් වන මම මේ නිවේදනයෙන්,

01. පිළියන්දල, බටකැත්තර, දේවාල පාර, නොඃ 277 දරන ස්ථානයේ පිහිටි "සමස්ත ලංකා කාර්යාල සේවකයන් ප්‍රවාහන සංගමය" නමැති සමිතිය ආරම්භ කරනු ලැබූ පරමාර්ථයන් ඒ ආඥාපනතෙහි බලතල හා පහසුකම් ව්‍යාප්ත කළ යුතු පරමාර්ථයන් වශයෙන් නියම කරමි; සහ

02. ඒ ආඥාපනතෙහි 5(4) වගන්තියේ විධිවිධානවලින් නිදහස් කිරීමෙන් ඒ ආඥාපනත අදාළ කිරීම එකී සමිතියට සීමා කරමි.

රිෂාඩ් බදියුදීන්,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය.

2017 ක් වූ මැයි මස 25 දින,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය,
73/1, ගාලු පාර,
කොළඹ 03.

06-619


1A - G 25665 - 12 (2017/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.